පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 222

ආයතනයේ නම: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියොග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 222

நிறுவனத்தின் பெயர்: சமுர்த்தி அபிவிருத்தித் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No: 222

Name of the Institution: Department of Samurdhi Development

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No: 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක-222

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
01	<u>නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ ගැටළු පැවතීම</u> සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේදී අධිකාරි වලින් අන්තර්ග්‍රහනය කරන ලද නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව පවතින ගැටළු සඳහා මෙතෙක් නිසි විසඳුම් ලැබී නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව, මෙම කරුණ සම්බන්ධයෙන් ලැබී ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ක්‍රියාත්මක නොවීමට හේතු වූ කරුණු පිළිබඳව විමසුවේය.	සමෘද්ධි පනතේ 44 (ඉ) (ii) වගන්තිය යටතේ දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගෙන් සේවක අර්ථසාධක අරමුදලෙන් 60% ක රජයේ දායකත්වය අය කිරීමට එරෙහිව එම නිලධාරීන් විසින් ගොනු කරන ලද අංක SC/FR/252/2015 දරන නඩුවේ සමත තීරණය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 60% මුදල අයකිරීමට එරෙහිව, ශ්‍රේෂ්ඨාධිකරණ ඉදිරියේදී SC/AP/45/2025 හා SC/CONTEMT/07/2025 දරන නඩු විභාග වෙමින් පවතී. මෙම අතරතුර නිලධාරීන්ගෙන් අයවිය යුතු 60% ට අදාළව 4% ක පොලී ප්‍රතිශතයක් අය කිරීමට 2023.02.20 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණයක් නිකුත් කර ඇත. ඒ අනුව, 2023.02.20 ට පසුව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබූ අය සඳහා හිඟ විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම කර නොමැත. 2025 අගෝස්තු මස 12 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/25/1323/818/085 දරණ අමාත්‍ය මණ්ඩල තිරණ දැනුම් දීමේ ලිපියට අනුව සේවක අර්ථසාධක අරමුදලේ 60% ක රජයේ දායකත්ව මුදල නැවත අයකර ගැනීමේදී අය කරනු ලබනුයේ රජයේ දායකත්වය වන 60% ක මුදල සඳහා 4% පොලිය එක් වරක් පමණක් වන අතර, එම මුදල අය කිරීම සඳහා විශ්‍රාම වැටුප් සකස් කර විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හා හිඟ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබාදී ඇත. ඒ අනුව 2023.02.20 දිනෙන් පසුව විශ්‍රාම වැටුප් ප්‍රදානය ලැබූ සියලු නිලධාරීන්ගෙන් 60%ට 4% ක පොලිය අයකර අදාළ හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
02	<u>**අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම**</u> සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වෘත්තීය ගැටළු විසඳා ගැනීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය කළ කාරක සභාව නව කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදු කිරීමේ කාර්යයේ වර්තමාන තත්වය සම්බන්ධයෙන් විමසීය.	දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමාලෝචනයක් සිදු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවකට පැවති කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලිය සඳහා 2023.09.12 දින අමාත්‍යාංශ ලේකම් මඟින් කාරක සභාවටද පිටපත් සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පිළිතුරු යොමු කරන ලදී. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ 25732 යුත් නව කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇත. මෙසේ අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අදාළව නව බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටි සඳහා කාලරාමු සකස් කිරීමටත් සෑම මසක 15 වන දිනට අදාළ ප්‍රගතිය ලබා දීමටත් 2024.01.10 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී නියෝග ලබාදී ඇත. ඒ අනුව, 2025.08.15 දිනට අදාළ ප්‍රගතිය 2025.09.12 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කර ඇත.
03	<u>**සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම**</u> සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමේ වැඩසටහන ආරම්භ කර ගත වී ඇති වසර 25 ක කාලය තුළ සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව කාරක සභාව විමසීමක් කලේය. දිළිඳු ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ප්‍රතිලාභ ලබා දීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් මෙම සමෘද්ධිලාභීන් ස්වයං රැකියා හෝ ආදායම් උපයා ගතහැකි වෙනත් වැඩ පිළිවෙලක් වෙත යොමු කර නිරන්තර අධීක්ෂණය කළ යුතු බවත් අවධාරණය කළ කාරක සභාව මෙම වැඩසටහන් සඳහා වෙනත් සුදුසු ආයතන සමඟ ඒකාබද්ධ වී කටයුතු කළ හැකි බවත්, ඒ පිළිබඳව විධිමත් සැලසුමක් සකස් කළ යුතු බවත් ප්‍රකාශ කළේය.සමෘද්ධි ව්‍යාපාරයට ඇතුළත් වන පවුල් වෙත නියමිත කාලයක් තුළ සපුරාලිය යුතු ඉලක්ක සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා මග	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පසුගිය දශක තුනක පමණ කාලය තුළ දිළිඳු හා අඩු ආදායම්ලාභී පවුල් මුහුණ දෙන දරිද්‍රතාවය, සමාජ සාධාරණත්වය විෂමතාවයන් හා විවිධ මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය අරමුදල් සපයා ගැනීම වැනි ආර්ථික හා සමාජීය ගැටළු වලින් මුදවා ගැනීමේ අරමුණින්,එකී පවුල් තිරසාර ජීවනෝපාය මාර්ගයකට යොමු කිරීම, ආදායම් ඉපැයීම් මාර්ග ශක්තිමත් කිරීම, සහනාධාර යැපුම් මානසිකත්වයෙන් මුදවා ගැනීම හා සමාජ ආරක්ෂණ ජාලයකින් ආවරණය ලබා දීම යන අංශ යටතේ ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය, හා වසම් මට්ටමින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවා, ප්‍රතිලාභ ඉලක්ක ගත ප්‍රජාව වෙත ලබා දීමට කටයුතු කරන ලදී. 2023 වර්ෂයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත සමෘද්ධි සහනාධාර වැඩසටහන වෙනුවට "අස්වැසුම" වැඩසටහන ක්‍රියාවට නැංවීමත් සමඟ "අස්වැසුම" ඇතුළු අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අස්වැසුම ලබන හා අස්වැසුම නොලබන අඩු ආදායම්ලාභී ඇතුළු පවුල් ලක්ෂ 20 ක් 2025 සිට 2029 දක්වා වසර 05 ක කාලය තුළ සවිබලගැන්වීම සඳහා දිගුකාලීන සැලස්මක් සකස් කරන ලද අතර, ඒ යටතේ

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
	පෙන්වීම ලබා දී ඒ පිළිබඳ පසු විපරමක් සිදු කිරීම අත්‍යාවශයෙන් කළ යුතු බවද කාරක සභාව මෙහිදී විශේෂයෙන් පෙන්වා දුන්නේය.	2025 වර්ෂයේ සවිබලගැන්වීමේ ඉලක්කය පවුල් ලක්ෂ 04 ක් වේ. එම සැලැස්මට අනුව, අඩු ආදායම්ලාභී පවුල් ජීවනෝපාය ප්‍රවර්ධනය, මනෝ සාමාජීය බලගැන්වීම, මූල්‍ය අන්තර්කරණය, සමාජ ආරක්ෂණය, පුහුණුව හා මගපෙන්වීම යන ප්‍රධාන ක්ෂේත්‍රයන් 05 ක් ඔස්සේ සවිබලගැන්වීම මඟින් රටේ සෑම පුරවැසියෙකුම ජාතික ආර්ථිකයේ අභිමානවත් කොටස්කරුවෙකු බවට පත්කිරීමට අපේක්ෂා කෙරේ. සවිබලගැන්වීම සඳහා තෝරාගනු ලබන සෑම පවුලක් සඳහාම පවුල් සංවර්ධන සැලැස්මක් සකස් කරනු ලබන අතර, එම පවුල් වලින් තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කෙරේ. අනතුරුව එම ප්‍රතිලාභීන් සඳහා ජීවනෝපාය තාක්ෂණික පුහුණුව හා වෘත්තිය/නිපුණතා පුහුණුව ලබාදීම සිදු කෙරේ. අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන් සඳහා ජීවනෝපාය ආධාර ලබාදීම හා අදාල මූල්‍ය සේවාවන් වෙත යොමු කිරීම හා විරැකියා තරුණයින් රැකියා මාර්ග සඳහා යොමු කිරීමට කටයුතු කෙරේ. මේ වනවිට සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ සවිබලගැන්වීම සඳහා සුදුසු පවුල් 232,146 ක් හඳුනාගෙන ඇත. පවුල් සංවර්ධන සැලසුම් 126,613 ක් සකස් කර ඇති අතර, ව්‍යාපාර සැලසුම් 6,608 ක් සකස් කර ඇත. වෘත්තීය පුහුණුව සඳහා තරුණයින් 13,065 හඳුනා ගෙන ඉන් තරුණයින් 239 රැකියාවන් සඳහා යොමු කර ඇත. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන හා සමෘද්ධි දෙපාර්තමේන්තු අරමුදල් භාවිතා කර අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. (ඇමුණුම-01).
04	<u>**අස්වැසුම සුබ සාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ හඳුනාගත් පවුල් ලක්ෂ12 ක් සවිබල ගැන්වීමේ වැඩ සටහන**</u> අස්වැසුම සුබ සාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා සමාන්තරව සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මේ වන විට ගෙන ඇති පියවර පිළිබඳව කාරක සභාව විමසුවේය.	සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සකස්කර ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/730/604/073 හා අමප/23/1811/604/178 සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ දුප්පත් හා අන්ත දුප්පත් අස්වැසුම ප්‍රතිලාභී පවුල් ලක්ෂ 12ක් සවිබලගැන්වීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. 02.ඒ අනුව, අස්වැසුම ප්‍රතිලාභී පවුල් ලක්ෂ 12ක් සවිබලගැන්වීම සඳහා වැඩසටහනක් 2024 සිට 2029 දක්වා ක්‍රියාත්මක කිරීමට සකස් කර, 2024.03.11දින පැවති අමාත්‍ය මණ්ඩලයට අමප/24/0456/629/006 අංක දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත.

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
		03.ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේදී පැවැත්වූ රැස්වීමකදී, සියලුම සමාජ කාණ්ඩයන් හා සමෘද්ධි සහනාධාර ලැබූ (දැනට අස්වැසුම ප්‍රතිලාභ නොලබන) පවුල් ද ඇතුළත්ව නව වැඩසටහනක් සකස්කර, ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජනාවී ඇත. 04.එම යෝජනාව අනුව පහත පරිදි සවිබලගැන්වීම සිදුකරන පවුල් ලක්ෂ 20ක් හඳුනාගැනීමට කටයුතු කෙරේ. අස්වැසුම ප්‍රතිලාභී පවුල් - 1,500,000 සමෘද්ධි සහනාධාර ලැබූ (දැනට අස්වැසුම නොලබන) අඩු ආදායම්ලාභී පවුල් - 500,000 මෙම නව පවුල් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර, අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත. මෙම නව වැඩසටහන යටතේ, අස්වැසුම ප්‍රතිලාභී පවුල් හා සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීම ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිදු කරමින් පවතී. එම පවුල්වලට ජීවනෝපාය ප්‍රවර්ධනය සඳහා පහත අංශවලට යොමු කිරීමට පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීමද ආරම්භ කර ඇත. **i.** ව්‍යාපාර අවස්ථාවලට යොමු කිරීම (ස්වයං රැකියා) **ii.** වෘත්තීය පුහුණුවෙන් පසුව දේශීය / විදේශීය රැකියාවලට යොමු කිරීම. ජීවනෝපාය ප්‍රවර්ධනය සඳහා රජයේ මූල්‍යාධාර හා සමෘද්ධි බැංකු ණය වශයෙන් ලබා දීමට කටයුතු සූදානම් කර ඇති බවද දන්වමි.

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
05	<u>**සමෘද්ධි බැංකුවල ක්‍රියාකාරිත්වය**</u> විගණන විශ්ලේෂණය අනුව වර්තමානයේ සමෘද්ධි බැංකු සතුව රුපියල් බිලියන255ක වත්කම් පවතින බවත්,මූල්‍ය වත්කම්වල වටිනාකම රුපියල් බිලියන 220ක් බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.එනමුත්,සමෘද්ධි බැංකුවල ණය ශේෂය රුපියල් බිලියව 70 ක් වන බව සහ එයින් රුපියල් බිලියන 10 ක් සේවකයන්ගේ ණය යටතට අයත් වන බවද, ආයෝජනවල වටිනාකම බිලියන 150 ක් වන බවද කාරක සභාවේ අවධානයට ලක් විය.	මේ අනුව 2025.07.31 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සතුව රු. බිලියන 321 ක වත්කම් පවතින අතර ආයෝජන වල වටිනාකම බිලියන 183 කි. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සතුව 2025.07.31 දිනට මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 151 ක් වන අතර සමස්ථ ණය ලබාදීම රුපියල් බිලියන 105 ක්වේ. එම රු. බිලියන 105 ක මුදල පහත සඳහන් පරිදි වේ. • 2025.07.31 දිනට පිටිහිටි සමස්ථ සේවක ණය මුදල - රු.මිලියන 4910.6යකි. • සමස්ථ සේවක පිටිහිටි ණය සංඛ්‍යාව = 18057 කි. • පිටහිටි ණය ප්‍රතිශතයක් ලෙස 4.67% කි. • ප්‍රතිලාභීන් සඳහා නිකුත්කර ඇති පිටිහිටි ණය මුදල-රු. මිලියන 100,298.4 කි. • සමස්ථ ප්‍රතිලාභීන් සඳහා නිකුත් කර ඇති පිටහිටි ණය සංඛ්‍යාව 1,002,254 කි. • පිටහිටි ණය ප්‍රතිශතයක් ලෙස 95.33% කි ඉහත රුපියල් බිලියන 105ක ප්‍රමාණයක් දක්වා ණය ප්‍රමාණය වැඩිකර ගැනීමට පහත සඳහන් ණය වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. **අඩු පොළී අනුපාතයන් යටතේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් ලබාදෙන ණය ප්‍රමාණ ඉහල නැංවිම** ➢ 2025.06. 30 දිනට සමෘද්ධි ප්‍රජාමූල බැංකු සතුව රුපියල් බිලියන 162 ක තැන්පතු ප්‍රමානයක් තිබෙන අතර, පිටිහිටි ණය ශේෂය රුපියල් බිලියන 103ක් වේ. 2024 වර්ෂයේ සිට සමෘද්ධී ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල පිටිහිටි ණය ශේෂය වැඩිකර ගැනිම සඳහා පහත සඳහන් ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කර ඇත. ➢ 2024.02.14 දිනැති 2021/16 (නව) හතරවන එකතුව මඟින් ලියසවිය ණය යෝජනා ක්‍රමය

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
		➤ 2024.03.27 දිනැති 2024/01 සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සඳහා **සමෘද්ධි අරුණළු සහන ණය යෝජනා ක්‍රමය** ➤ 2024.04.18 දිනැති 2024/04 රාජ්‍ය සේවකයින් සඳහා සමෘද්ධි **ලක්සර ණය** යෝජනා ක්‍රමය ➤ 2024.05.20 දිනැති චක්‍රලේඛ ලිපියෙන් ලිය සවිය ණය යෝජනා ක්‍රමයෙන් **පෙර පාසල් ගුරුවරුන් සඳහා ණය ලබාදීම.** ➤ 2024.10.29 දිනැති 2020/22 ට පලමු එකතුව මඟින් **නව සමෘද්ධි ව්‍යවසායක සංවර්ධන ණය යෝජනා ක්‍රමය තුලින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ආදායම් උත්පාදන ව්‍යාපෘති තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 20 සිට 50 දක්වා ව්‍යවසායක සංවර්ධන ණය මුදල් වැඩිකිරීම.** **<u>සමෘද්ධි ව්‍යාපාරයේ සාමාජිකයන් නොවන අස්වැසුම් හිමිකම්ලාභී පවුල් සවිබල ගැන්වීමේ කටයුතු සඳහා</u>** ➤ 2025.08.07 දිනැති 2025/10 චක්‍රලේඛ මඟින් ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන -2025 යටතේ හඳුනාගත් අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා **සමෘද්ධි සවිබල ණය** යෝජනා ක්‍රමය හඳුන්වා දීම හා සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් සමෘද්ධි රන්පත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ. (ඇමුණුම 02)

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

සම්පත් මන්ත්‍රීනායක
ලේකම්
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ
ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය.

භාණ්ඩාගාර ප්‍රතිපාදන හා සමෘද්ධි දෙපාර්තමේන්තු අරමුදල් භාවිතා කර ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

වැඩසටහන	ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අරමුදල් මූලාශ්‍රය
අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 04 ක් සවිබලගැන්වීම	4,618.00	400,000	භාණ්ඩාගාර ප්‍රතිපාදන
අඩු ආදායම්ලාභී පවුල් සඳහා කෂුද්‍රමූල්‍ය ණය ලබා දීම. (ස්වයං රැකියා, කෘෂිකාර්මික, නිවාස වැනි කාර්යයන් සඳහා)	45,000.00	350,000	සමෘද්ධි ප්‍රජාමූල බැංකු අරමුදල්
සමෘද්ධි බැංකු සාමාජිකත්වය පිරිනැමීම හා කොටස් මුදල් රැස් කිරීම.	1,825.00	121,981	සමෘද්ධි ප්‍රජාමූල බැංකු අරමුදල්
වැන්දඹු, ආබාධිත හා විශේෂ දුෂ්කරතා ඇති පවුල් සඳහා රු. 750,000 දක්වා නිවාස ඉදි කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම.	604.22	1,400	සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල
අඩු ආදායම්ලාභී පවුල්වල අ.පො.ස උ.පෙළ හදාරන දරුවන් වෙනුවෙන් මාසිකව රු.1,500 බැගින් මාස 24 ක් සඳහා සිප්දොර අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම.	661.48	40,341	සමෘද්ධි සමාජ සංවර්ධන අරමුදල
අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධනය හා ආදායම් උත්පාදන ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍යාධාර පහසුකම් ලබාදීම	127.47	1,523	සමෘද්ධි සමාජ සංවර්ධන අරමුදල
අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්වය, සමාජීය හා මානසික ප්‍රවර්ධනය උදෙසා මත්ද්‍රව්‍ය නිවාරණ හා සනීපාරක්ෂක කටයුතු, මනෝ උපදේශක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	83.72	180,226	ජාතික සමාජ සංවර්ධන අරමුදල
එකතුව	52,919.89	1,095,471	

ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි සහනාධාර දීමනාව නතර කිරීමෙන් පසු වුව ද අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික හා සාමාජීය සංවර්ධනය වෙනුවෙන් භාණ්ඩාගාර අරමුදල් හා දෙපාර්තමේන්තුගත අරමුදල් භාවිතා කර වාර්ෂිකව රු.මි.52,919.89 ක පමණ මූල්‍ය වටිනාකමකින් යුත් වැඩසටහන් ක්‍රියාත්මක කරන බව සඳහන් කල හැකිය.

සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිලාභ අඩුආදායම්ලාභී පවුල් අතරින්, දැනට අස්වැසුම ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීම හා ඔහුන්ගේ ආදායම් මාර්ග සංවර්ධනයට පහත වැඩසටහන් යටතේ පහසුකම් සලසා ඇත.

I. 2025-2029 පස් අවුරුදු ප්‍රජා සවිබලගැන්වීම් සැලැස්ම යටතේ, සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභි පවුල් වසරකට 100,000 බැගින් මුළු පවුල් 500,000 ක් ආර්ථික,සමාජීය හා

මානසික වශයෙන් ප්‍රධාන ක්ෂේත්‍රය 03 න් සවිබලගැන්වීමට තෝරාගැනීම, ඒ සඳහා මුල්‍ය , මුල්‍ය නොවන පහසුකම්, පුහුණුව හා දැනුම ලබාදීමට කටයුතු කිරීම.

II. සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති මගින්, ආදායම් උත්පාදන ව්‍යාපෘති වෙනුවෙන් රු.100,000 සිට රු.5,000,000 දක්වා ණය මුදල් ලබාදීම. ඒ අනුව සමෘද්ධි ජාලය විසින් වසරකට සමාජිකයින් 300,000 ක් වෙනුවෙන් රු මිලියන.25,000 ආසන්න මුදලක් ණය ලෙස ලබාදීමට කටයුතු කිරීම.

III. සමාජ ආරක්ෂණ අරමුදල මගින් වාර්ෂිකව ලබාදෙන අරමුදලින්,ස්වංරැකියා,කෘෂිකාර්මික වැනි කාර්යයන් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා මුල්‍ය ආධාර ලබාදීම හා නිෂ්පාදන ගම්මාන ඇතිකිරීම තුලින්,දුප්පත්කමින් මුදවා ගැනීමට කටයුතු කිරීම.

IV. සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභී පවුල් ඇතුළු අනිකුත් බැංකු සමාජිකයින්ට වසරකට 12% (වාර්ෂික සඵල වාර්ෂික පොළී අනුපාතය 6.1%) යටතේ ආපසු ගෙවීමට උපරිම මාස 96 කාලයක් සහිත සහන රැසක් ඇතුලත් ණය වැඩසටහන් හඳුන්වාදීම.

V. රේඛීය අමාත්‍යාංශ හා වෙනත් රාජ්‍ය ආයතන, ස්වේච්ඡා ආයතන මගින් සලසන සේවා හා පහසුකම් මෙම ඉලක්ක ගත ජනතාවට ලබාදීමට සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/05/08/01/ චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ....
දිනය / திகதி / Date: 2025.08. 07

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2025/10

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,

ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන - 2025 යටතේ හඳුනාගත් අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභීන් සඳහා සමෘද්ධි සවිබල ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම හා සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් සමෘද්ධි රන්පත ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමට අවසර ලබාදීම

01. හැඳින්වීම.

අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන හා සමෘද්ධි සහනාධාර ලැබූ (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන) අඩු ආදායම්ලාභීන් ආර්ථික, සමාජීය හා මානසික ප්‍රධාන ක්ෂේත්‍රයන් යටතේ බලගැන්වීමේ අරමුනින් ප්‍රජා සවිබලගැන්වීම - 2025 සඳහා වැඩසටහනක් සකස් කර, ජාතික /දිස්ත්‍රික්/ප්‍රාදේශීය/ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරමින් සිටී.

ඒ අනුව, 2025 වර්ෂය තුළ, ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන යටතේ අස්වැසුම ප්‍රතිලාභී හිමි පවුල් 300,000 ක් තෝරාගෙන, ඉහත කී ක්ෂේත්‍ර යටතේ බලගැන්වීමට කටයුතු කෙරේ. ආර්ථික ක්ෂේත්‍රය යටතේ සවිබලගැන්වීමේදී ඵලදායී ස්වයං රැකියාවක/කෘෂිකාර්මික කාර්යයක හෝ රැකියාවක් අපේක්ෂාවෙන් සිටින තරුණ/තරුණියන් වෘත්තීය පුහුණුවකට යොමුකර ,ඉන් අනතුරුව රැකියාගත කිරීම/ ව්‍යාපාරයකට යොමුකර, එම පවුලේ ජීවනෝපාය සංවර්ධනයට හවුල් කරගැනිමට අපේක්ෂා කෙරේ.

මෙහිදී, ඉහත කී ජීවනෝපාය මාර්ග වෙනුවෙන් යොමුවන ප්‍රතිලාභීන්ට,මූල්‍ය පහසුකම් සැලසීමට සමෘද්ධි බැංකු කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී සහනදායී පොළී අනුපාතයක් සහිතව ණය පහසුකම් ලබාදීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව, නව ණය වැඩසටහන හඳුන්වාදීමට 2025.04.01 හා2025.07.23 දිනවලදී පැවති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2025/135/06 හා 2025/138/06 යටතේ ලබාදුන් අනුමැතිය මත සිදුකරන බවද දන්වමි.

02. ණය ලබාදෙනු ලබන්නේ කවුරුන් සඳහාද?

i. 2025 වර්ෂයේ සවිබලගැන්වීම් වැඩසටහන යටතේ, අස්වැසුම සමාජ සුභසාධන ප්‍රතිලාභ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී බැංකු සමාජිකයින්,
ii. සවිබලගැන්ම සඳහා තෝරාගත් පවුලක වෘත්තිය පුහුණුවකින් පසුව රැකියාගත කිරීම/ව්‍යාපාර අවස්ථාවකට යොමු කරන තරුණ/තරුණියක් සිටින පවුලක මව/පියා වන බැංකු සමාජිකයින්,

03. සම්පූර්ණ කළ යුතු සුදුසුකම්

I. සමෘද්ධි බැංකු සාමාජිකත්වය ලබාගෙන සති 02ක් හෝ ඊට වැඩි විය යුතු අතර, ඉල්ලුම් කරන ණය මුදලින් 1/10ක් හෝ ඊට වැඩි මුදලක් කොටස් ගිණුමේ තිබිය යුතුය.
II. ප්‍රජාමූල සංවිධාන සාමාජිකත්වය ලබාගෙන තිබීම.
III. කුඩා කණ්ඩායම් ගතවීම.
IV. සමෘද්ධි බැංකු සමාජික තැන්පත් ගිණුමක් තිබීම.
V. ලබාගත් සමෘද්ධි බැංකු ණය මුදලක් පැහැරහැර නොතිබීම.
VI. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මගින්, ස්වංරැකියා හෝ රැකියා ගත කිරීම් වෙනුවෙන් මූල්‍යාධාරයක් ලබන හෝ නම් කරන ලද පවුලක් නොවීම.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

	අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)	ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant	අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance)	කාර්යාලය / அலுவலகம் / Office
Tel-	011-2869824	011-2873799	011-2869742	011-2889003	0112872202
Fax -	011-2889002	011-2873996	011-2869742	011-2887469	

4. උපරිම ණය මුදල, වාර්ෂික පොලී අනුපාතය හා ආපසු ගෙවීම් කාලය

4.1 අස්වැසුම ප්‍රතිලාභින් සදහා,

අස්වැසුම සමාජ ප්‍රතිලාභ කාණ්ඩය	උපරිම ණය මුදල (රු) (එක් සමාජිකයකු ට)	ඇස්මේන් තුගත මුළු ණය සංඛ්‍යාව (ජාතික)	ණය මුදල (රු.මි)	එක් සමෘද්ධි බැංකුවකට ලබාදිය හැකි උපරිම ණය සංඛ්‍යාව	වාර්ෂික පොලී අනුපාතය(%)		
					ණයකරු ගෙන්	මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ	එකතුව %
අන්ත දුප්පත් හා දුප්පත් සමාජ කාණ්ඩය	100,000	40,000	4,000	36	8%	4%	12%
සංක්‍රාන්තික/අවදානමට ලක්වූ සමාජ කාණ්ඩය	200,000	7,000	1,400	6	9%	3%	12%
	250,000	3,000	750	3	9%	3%	12%
එකතුව	-	**50,000**	**6,150**	**45**	-	-	-

4.2. මෙම ණය වැඩසටහන යටතේ, පොලී ගණනය සිදුකරනු ලබන්නේ හීනවන පොලී (Reducing rate) ක්‍රමවේදය අනුව වේ.

4.3. සියළුම සමාජ කාණ්ඩ යටතේ, එක් සමෘද්ධි බැංකුවකට සමාජිකයින් උපරිම 45 දෙනෙකුට ණය මුදලක් ලබාදිය හැක.මෙම ණය වැඩසටහන සහනදායී වාර්ෂික අනුපාතයන් යටතේ ලබාදෙන අතර, සමෘද්ධි බැංකුවට අහිමිවන පො මුදල, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාර අරමුදලින් බැංකුවට ලබාදීමට කටයුතු කෙරේ.

4.4. අක්‍රිය(බොල් ණය ඇතුළු) ණය සම්බන්ධව,දැනට පවතින උපදෙස් එපරිද්දෙන් මෙම ණය වැඩසටහනටද වලංගු කරගත යුතුය.මෙහිදී, බොල් වූ ණය මුදලක් ආපසු අයකර ගැනීමේ දී, වාර්ෂිකව 12% ක පොලී අනුපාතයට නොපියවූ (පිටහිටි)ණය මුදල ණයකරුගෙන් අයකරගත යුතුය. මෙහිදී බොල් ණය මුදල් සදහා සහන පොලී මුදල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිපූර්ණය කිරීමක් සිදු නොකෙරේ.

05. ආපසු ගෙවීම් කාලය හා ලබාදෙන උපරිම සහන කාලය

5.1

ණය මුදල	ආපසු ගෙවීම් කාලය මාස
රු.100,000 හෝ ඊට අඩු	48
රු.100,000 ට වැඩි 200,000 හෝ ඊට අඩු	54
රු. 200,000 ට වැඩි 250,000 හෝ ඊට අඩු	60

5.2 ණය ආපසු ගෙවීමට සහන කාලයක් ලබාදීමේ දී, කෘෂිකාර්මික කටයුතු/වෘත්තීය පුහුණුව සදහා ලබාදෙන ණය සදහා උපරිම මාස 06 ක්ද, අනිකුත් ව්‍යාපෘති සදහා මාස 12 ක් හෝ ඊට අඩුවිය යුතුය.

5.3 සහන කාලය ලබාගන්නා විටක, සහන කාලය ඇතුළත්ව දි ඇති උපරිම කාලය තුල ණය ආපසු ගෙවීමට බැදී සිටින අතර,සහන කාලය තුළ මාසික පොලී මුදල ණයකරු සමෘද්ධි බැංකුවට ගෙවීම කළ යුතුය.

06. ණය ලබාදෙන කාරණාවන්

හදුනාගත් පවුල් වල ජිවනෝපාය සංවර්ධන ක්ෂේත්‍රය යටතේ ව්‍යාපාර අවස්ථා හා රැකියා මාර්ග වෙනුවෙන් ණය ලබාදිය යුතුය.

i කෘෂිකාර්මික, කර්මාන්ත, වෙළඳ, සේවා ඇතුළු සෑම නීත්‍යානුකූල ස්වයං රැකියා වෙනුවෙන් කාරක හා ප්‍රාග්ධන මුදල් අවශ්‍යතා වෙනුවෙන්,

ii තරුණ/තරුණියන් විසින් හදාරනු ලබන වෘත්තීය පුහුණුවට වැයවන පාඨමාලා ගාස්තුව .සදහා,

iii. ස්වයං රැකියාවක/කෘෂිකාර්මික කාර්යයකට අදාල වන තාක්ෂණික පුහුණු වැඩසටහන් වෙනුවෙන් පාඨමාලා ගාස්තු වියදම් දැරීම.

07. ඇප සුරැකුම්

පහත එක් සුරැකුමක් පමණක් ලබාගෙන ණය මුදල් නිදහස් කලයුතුය.

1. කුඩා කණ්ඩායම්(සමුහ තැන්පත්) ඇපය ,
2. කුඩා කණ්ඩායම් ඇපය ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවක, පහත පරිදි ණය මුදල අනුව සුදුසු ඇප සුරැකුමක් මත ණය මුදල් දියයුතුය.

1. රු.100,000 දක්වා වූ ණය මුදලක් නම්, එම සමෘද්ධි බැංකුවේම සක්‍රිය සමාජික/දිරියමාතා/සමාජික නොවන/අනිවාර්ය ඉතිරිකිරීම් හෝ ස්ථාවර තැන්පතු ගිණුම් හිමි ඇපය මත දිය යුතුය. මෙහිදී උපරිම ගිණුම් හිමියන් දෙදනෙකුගේ (02) ගේ තැන්පතු මුදල ඇපයට ලබාගැනිමට ඉඩ දෙනු ලැබේ. මෙහිදී,එකී ගිණුම් වල පවතින තැන්පතු ශේෂ එකතුව ලබා ගන්නා ණය මුදලට සමාන විය යුතුය. මෙම තැන්පතු මුදල් නිදහස් කිරිම තාවකාලිකව නතර කළ යුතුය.(HOLD)

2.රු.250,000 දක්වා, රාජ්‍ය සේවකයකුගේ(01) පුද්ගල ඇපයක් මත ද ණය මුදල් දියහැකිය.

3. චංචල/නිශ්චල දේපල ඇප ලබා ගැනීම සිදු නොකළ යුතුය.

08. ණය ඉල්ලුම් කිරිම, ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම හා ණය අනුමත කිරීම.

8.1 ණය ඉල්ලුම් කිරිමේදී, දැනට හඳුන්වා දී ඇති ණය ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර අදාල නිර්දේශ සමඟ සමෘද්ධි බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

8.2 ව්‍යාපෘතිය සඳහා වූ ව්‍යාපෘති වාර්තාව සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් ණය ඉල්ලුම්කරු සමඟ සාකච්ඡා කර පිළියෙල කල යුතුය. ඉන් අනතුරුව බැංකු කළමනාකරු හෝ බලය පැවරූ නිලධාරියකු විසින් පරික්ෂා කර කල යුතුය.

විශේෂ ව්‍යාපෘතියක් නම්, ව්‍යාපෘති වාර්තාව සමෘද්ධි සමිතියට යොමුකර, ව්‍යාපෘතියේ ශක්‍යතාවය පිළිබඳ ඇගැයිම් වාර්තාවක් ලබාගැනිමෙන් අනතුරුව, පාලක මණ්ඩලයට ඉදිරිපත් කර ණය මුදලට අනුමැතිය ලබාගත යුතුය.

09. ණය මුදල නිකුත් කිරිම.

1. ණය මුදල මුදා හැරීම
   - හර - ලැබිය යුතු ණය සමෘද්ධි සවිබල ගිණුම (කේත අංක-3198)
   - බැර - සමාජික තැන්පතු ගිණුම

2. ණය මුදල් ආපසු අයකර ගැනිම.(ණයකරුගෙන් අයකර ගන්නා පොලි මුදල සමඟ)

   <u>පළමු පියවර</u>
   - හර - සමාජික තැන්පත් ගිණුම (ණයකරුගෙන් අයකරගනු ලබන ණය පොලි මුදල හා මාසික ණය වාරිකය)
   - හර - ලැබිය යුතු සහන පොළී මුදල් ගිණුම -සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (කේත අංකය-3324) (දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණ කරගත යුතු පොළී මුදල)
   - බැර - ලද පොලී - දුන් ණය ගිණුම (ණයකරුගෙන් අයකරගත් හා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු මුළු පොළී මුදල වල එකතුව)
   - බැර - ලැබිය යුතු සමෘද්ධි සවිබල ණය ගිණුම (ණය මුදලහි මාසික ණය වාරික මුදල)

3, ලැබිය යුතු සහන පොළී මුදල් ගිණුම -සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් නව ගිණුමක් පොදු ලෙජරයේ ආරම්භ කර, පවත්වාගෙන යායුතුය.

4. බොල්ණය සඳහා වෙන්කිරීම සඳහා ලෙජරයේ නව ගිණුමක් "බොල්ණය ගිණුම - සමෘද්ධි සවිබල නමින් (කේත අංක -3297) විවෘත කල යුතුය.

5. බොල්ණය මුදලක් ආපසු අයකරගැනීමේදී, දැනට දී ඇති උපදෙස් හා පියවරයන් අනුගමනය කර ගිණුම් සටහන් කළ යුතුය.

10. ණය සංරක්ෂණ හා සමූහ සංරක්ෂණ අරමුදලට දායකවීම.

මෙම ණය වැඩසටහන යටතේ නිදහස් කරන සෑම ණය මුදලක් සඳහා ණය හා සමූහ සංරක්ෂණ අරමුදලට දායක විම අනිවාර්ය වේ.

11. සමෘද්ධි සවිබල ණය පොළී මුදල් ප්‍රතිපූර්ණය කිරිම

11.1 සෑම සමෘද්ධි බැංකුවක්ම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයකර ගතයුතු පොළී මුදල් සඳහා ඉල්ලීම මාස 03 වරක් ඇමුණුම 01 පරිදි සකස් කර ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතුය.

11.2 ඉල්ලීම සමඟ පරිගණක මෘදුකාංගය මගින් ලබාදෙන වාර්තාවේ පිටපතක් ද කළමණාකරු සහතික කර එවිය යුතුය.

11.3 ක්ෂුද්‍ර මූල්‍ය අංශය එවන පොළී මුදලට අදාල චෙක්පත ලද පසු, බැංකුගත කර උපලබ්ධි වූ පසු පහත ගිණුම් සටහන තබා ගිණුම්ගත කිරීම් කළ යුතුය.
- හර - ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම
- බැර - ලැබිය යුතු සහන පොළී මුදල් ගිණුම -සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

යම් විශේෂ අවස්ථාවක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු සහණ පොළී මුදල, දෙපාර්තමේන්තුවෙන් ලබානොදීමට තීරණය කලහොත් එම පොළී මුදල ණයකරුගෙන් අයකරගැනීම හෝ බැංකුවේ වියදමක් ලෙස පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

මේ සම්බන්ධව, ක්ෂුද්‍රමූල්‍යා අංශයෙන් ලිඛිත උපදෙස් ලබාගැනීම අනිවාර්ය වේ.

හර - සමාජික තැන්පත් ගිණුම/මිශ්‍ර වියදම් ගිණුම
බැර - ලැබිය යුතු සහන පොළී මුදල් ගිණුම -සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

12. මෙම ණය වැඩසටහන යටතේ ණය ලබාගත් සමාජිකයින්ට අනිකුත් සමෘද්ධි බැංකු ණය වැඩසටහන් යටතේ ණය ලබාගැනීමට බාධාවක් නොමැත.

13. සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභීන්ට සමෘද්ධි රන්පත ණය වැඩසටහන මගින් ණය ලබාදීම

සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ (අස්වැසුම නොලබන) අඩු ආදායම්ලාභීන් අතරින්, සවිබලගැන්වීම සඳහා හදුනාගත් අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධන සදහා අවශ්‍ය කරන ව්‍යාපාර ණය සමෘද්ධි රන්පත ණය වැඩසටහන යටතේ ලබා දීමට අවසර ඇත.

ඒ අනුව, හදුනාගත් සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභීන්ගේ, ව්‍යාපාර අවස්ථා (ස්වයං රැකියා) හා රැකියා අභිමුඛ වෘත්තීය පුහුණු අවස්ථා වෙනුවෙන් රන්පත ණය වැඩසටහන යටතේ ණය මුදල් දිය යුතුය.

පොළී අනුපාත ඇතුළු අනිකුත් කාරණාවන් සඳහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/16 (නව) හා ඊට එකතුන් හි උපදෙස් පිළිපැදීම කලයුතුය.

14.සමෘද්ධි සවිබල ණය වැඩසටහන යටතේ ලබාදෙන ණය මුදල් පිළිබඳ ප්‍රගතිය,දැනටමත් හදුන්වා දී ඇති ආකෘතිය අනුව සකස් කර මාසිකව ලබාදීම සිදුකල යුතුය.

15. මෙම නව ණය වැඩසටහන සඳහා ,පරිගණක මෘදුකාංගයේ අදාල කටයුතු සංවර්ධනය වීමෙන් පවතින අතර,එම කාර්යය කඩිනමින් සිදුකර ඔබ දැනුවත් කරයි.එතෙක්,ණයකරුවන් හදුනාගැනීම,ණය ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීම සහ ව්‍යාපෘති වාර්තාවන් සකස් කරගැනීම සිදුකර ගන්නා ලෙස දන්වමි.පරිගණක මෘදුකාංගයට තොරතුරු ඇතුලත් කිරීමේ කටයුතු නොකරන ලෙසත් දන්වමි.

16.මෙම චක්‍රලේඛය සඳහන් නොවන අනිකුත් උපදෙස් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2021/.06 (නව) හා ඊට එකතුන් හි සඳහන් උපදෙස් තවදුරටත් වලංගු කරගත යුතුය.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

01	ලේකම් - ග්‍රාම සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය	- කා.දැ.ස.
02	දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	- කා.දැ.ස.
03.	ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.	- අ.ක.ස.
04.	සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	- දැ.ස.හා අ.ක.ස.
05	දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.	- දැ.ස.හා අ.ක.ස.
06.	ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.	- අ.ක.ස.
07.	දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	- අ.ක.ස.
08	සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය	- කා.දැ.ගැ.ස.